**30-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබගේ පාප බර සැහැල්ලු කර ගැනීම සඳහා අතීතයේ කළ කී දේ පිළිබඳව පරමාත්ම පියා කෙරෙහි වූ විශ්වාසයකින් හා අවංකව ලියා ඉදිරිපත් කිරීමෙන් ඉන් අඩකටම සමාව ලැබෙනු ඇත.

**ප්‍රශ්නය:** සංගම යුගයේදී ඔබට පැළ කළ නොහැක්කේ කුමන බීජය ද?

**පිළිතුර:** ශාරීරික අවධානයේ බීජය. මුළු පාප ගසම වර්ධනය වන්නේ මෙම බීජයෙනි. දැනට මෙම පාප පහේ ගස මුළු ලෝකය පුරාම වර්ධනය වෙලයි තිබෙන්නේ. සෑම කෙනෙක්ම දිගින් දිගටම රාගයේ හා කෝපයේ බීජ පැළ කරමින් සිටිනවා. පරමාත්ම පියාගෙන් ඔබට ලැබෙනා උපදේශයන් නම්: දරුවනි, යෝග බලයෙන් පාරිශුද්ධ වන්න. ඒ බීජ පැළ කිරීම නතර කරන්න.

**ගීතය:** ඔබ ලැබීමෙන් අප මුළු ලොවම ලැබුවා වේ!

ඕම් ශාන්ති. ආදරණීය ආධ්‍යාත්මික දරුවන්ට ගීතය ඇසුණා. දැනට සිටින්නේ ඔබ ටික දෙනයි. ඉක්මනින්ම තවත් බොහෝ දරුවන් පැමිණේවි. දැනට සැබවින්ම ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් බවට පත්ව සිටින්නේ ඔය ටික දෙනා පමණක් වුණාට සෑම කෙනෙක්ම පාහේ ඔහු ගැන දන්නවා. ඔහුව හඳුන්වන්නේ ප්‍රජාවගේ පියා වන බ්‍රහ්ම යන නමිනුයි. බොහෝ දෙනෙක් සිටිනවා. සෑම ආගමකම අය ඔහුව අනිවාර්යෙන්ම භාර ගනීවි. මිනිසුන්ව නිර්මාණය වූයේ ඔවුන් හරහායි. ශාරීරික පියවරුනුත් සීමිත බ්‍රහ්මවරුන් වන බව බාබා පැහැදිලි කර කියා දී තිබෙනවා. මන්ද ඔවුන් මගිනුත් පරම්පරා ගසක් නිර්මාණය වෙනවා. පරම්පරා ගස වැවෙන්නේ වාසගමට අනුවයි. ඒ සීමිත පියවරුනුයි: මොහු (බ්‍රහ්මා) අසීමිත පියායි. මොහුගේ නම ප්‍රජාපිතා යන්නයි. ශාරීරික පියවරුන් සීමිත පවුල් නිර්මාණය කරනවා. ඇතැම් අය පවුලක් නිර්මාණය කරන්නේ නැහැ. මොහු අනිවාර්යෙන්ම නිර්මාණය කරනවා. ප්‍රජාපිතා බ්‍රහ්මාට දරුවන් නැතැයි කියා කියනා කෙනෙක් සිටීවිද? මුළු ලෝකයේම සිටිනා මිනිසුන් ඔහුගේ දරුවනුයි. ප්‍රජාපිතා බ්‍රහ්මා තමයි ප්‍රධානතම. මුස්ලිම්වරුන් පවා ආදම් සහ බීබිව සිහි කරනවා. එසේ කීමේදී ඔවුන් අනිවාර්යෙන්ම කවුරු හෝ කෙනෙක් ගැන කතා කරනවා විය යුතුයි. ප්‍රජාපිතා බ්‍රහ්මාව සඳහන් කර ඇත්තේ ආදම් හා ඒව, ආදිදේව් හා ආදි දේවි කියලායි. සෑම ආගමිකයෙක්ම ඔහුව විශ්වාස කරනවා. සැබවින්ම සීමිත පියෙක් සිටිනා අතර අනිත් කෙනා අසීමිත පියායි. එ අසීමිත පියා තමයි අසීමිත සතුටක් දෙන්නේ. ඔබ උත්සාහ දරන්නේ දෙව්ලොව අසීමිත සතුට ලබා ගැනීමටයි. ඔබ මෙහි පැමිණ සිටින්නේ අසීමිත පියාගෙන් අසීමිත සතුටේ උරුමය දිනා ගැනීමටයි. දෙව්ලොව අසීමිත සතුටකුත් අපායේ අසීමිත දුකකුත් ඇති බව කියා තිබෙනවා. මහා විශාල දුකක් පැමිණීමට නියමිතයි. වේදනාබර හැඬීම් දසත පැතිරේවි. පරමාත්ම පියා මුළු ලෝකයේම මුල, මැද හා අග පිළිබඳ වූ රහස් ඔබට පහදා දී තිබෙනවා. ඔය දරුවන් ඔහු ඉදිරියේම අසුන් ගෙන සිටිමින් උත්සාහ දරනවා. ඔහු මවත් පියාත් වෙනවා. දරුවන් රැසක් සිටිනවා. අසීමිත මව හා පියා කෙරෙහි කිසිම කෙනෙක් එදිරිවාදිකමක් ඇති කර ගන්නේ නැහැ. මවගෙන් හා පියාගෙන් ඔබ විශාල සතුටක් ලබනවා. ඔබ තමයි මව ඔබ තමයි පියා කියා මිනිස්සු ගීත ගායනා කරනවා. මෙම කරුණ තේරුම් ගත හැක්කේ දරුවන්ටම පමණයි. අනිකුත් ආගම් වල අය පරමාත්ම පියාට කන්නලව් කරනවා. මවට, පියාට කියා කතා කරන්නේ නැහැ. ඔබ තමයි මව ඔබ තමයි පියා කියා අමතන්නේ මෙහිදී පමණයි. ඉගෙන ගැනීමෙන් අපි සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් දේවතාවරුන් බවටත් කටු වලින් මල් බවටත් පත් වන බව ඔය දරුවන් අවබෝධ කරගෙන සිටිනවා. පරමාත්ම පියා බෝට්ටුකරු මෙන්ම උයන්පල්ලා ද වෙනවා. ඔය සෑම බ්‍රහමිණ්වරයෙක්ම එක් එක් වර්ගයේ උයන්පල්ලන් වෙනවා. මෝගල් උයනටත් උයන්පල්ලෙක් සිටිනවා. ඔහුට ඉතාමත් හොඳ වේතනයක් ලැබෙනවා. එක් එක් මට්ටම් වල උයන්පල්ලන් සිටිනවා. ඇතැම් අය ඉතාමත් ලස්සන මල් වවනවා. මල් අතරත් රජ මල් තිබෙනවා. ස්වර්ණමය යුගයේ මල් රජවරුන් මල් රැජිණියන් සිටිනවා. දැනටත් අධිරාජ්‍යවරුන් හා රාජිණියන් සිටියත් ඔවුන් මල් වගේ නැහැ. අපිරිසිදු වීමෙන් ඔවුන් කටු වෙලා. ඉදිරියට යන අතර ඔවුන් කටු වගේ ඇණගෙන යන්න යනවා. ඔවුන්ට කියන්නේ අජාමිල් කියලයි. ඔබ තමයි ඉහළම භක්තිය කළ අය. බලන්න පාප මාර්ගයේදී ඔවුන් පරිහාණියේ කිළිටි ප්‍රතිමා සාදා ඇත්තේ කෙසේද කියලා. දේවතාවරුන්ගේ ප්‍රතිමා කියා පෙන්නුවත් ඒවා පාප මගේ ප්‍රතිමායි. ඔය දරුවන්ට දැන් මේ කරුණු තේරෙනවා. ඔබලා දැන් බ්‍රහමිණ්වරුන් වෙලාය. අපි පාපයන්ගෙන්

ඈතට ඈතට යන්න යනවා. බ්‍රහ්මිණ්වරුන් අතර සහෝදරයෙක් හා සහෝදරියක් පාපයේ ගැලීම ඉතාමත් විශාල අපරාධකාරි ක්‍රියාවකි. ඔවුන්ගේ නම කැත වී යනවා. මෙන්න මේ නිසා තමයි බාබා කියන්නේ: ළමා කල සිට තමා විසින් කළ සියලුම කිළිටි ක්‍රියා ගැන බාබාට කියන්න. එවිට ඉන් බාගයකට සමාව ලැබෙනු ඇත. නමුත් කිළිටි ක්‍රියාවක් කළේ කොයි වේලාවේද කියා ඔබට මතකයි නේද? ඒවා ලියා සටහන් කර බාබාට දෙන්න. ඉතාමත් විශ්වසනීය හා අවංක දරුවන්: බාබා, මම මෙන්න මේ නරක දේ කළා. මට සමා වන්න කියා ලියාවි. පරමාත්ම පියා කියනවා: ඔබට සමාව දෙන්න බැහැ. කෙසේ වෙතත්, ඔබ ඇත්ත කියූ නිසා ඔබගේ බර සැහැල්ලු වෙනවා. ඔබට එය මුලුමනින්ම අමතක කර දැමිය හැකි වන්නේ නැහැ. අමතක කළ නොහැකියි. ඉදිරියේදී තවත් එවැනි දේ නොකිරීමට ඔබට අනතුරු අඟවා තිබෙනවා. කෙසේ වෙතත් ඔබගේ හෘද සාක්ෂිය ඔබට වද දේවි. බාබා, අපි අජාමිල් වැනියි කියා ඔවුන් කියනවා. මෙය අදාල වන්නේ මේ වත්මන් උපතටයි. ඔබ පාපකාරි මාවතට ගොස් පාපකාරී ජීවාත්මයක් වූයේ කවදාදැයි කියා ඔබත් දන්නවා. පරමාත්ම පියා දැන් අපව පින්වත් ජීවාත්මයන් බවට පත් කරවනවා. පින්වත් ජීවයන්ගේ ලෝකය වෙනම ලෝකයක්. ලෝකය එකම ලෝකයක් වුවත් එය කැලි දෙකකට බෙදී ඇති බව ඔබට තේරෙනවා. එකක් දෙව්ලොව කියා හඳුන්වන පින්වත් ජීව සත්තාවන්ගේ ලෝකය. අනික දුක් ලෝකය හෝ අපාය කියා හඳුන්වන පාපකාරි ජීව සත්තාවන්ගේ ලෝකය. සතුටු ලෝකයක් හා දුක් ලෝකයක් තිබෙනවා. දුක් ලෝකයේදී සෑම කෙනෙක්ම තමන්ව ඉන් මුදවාගෙන නිවස වෙත ගෙන යන්නැයි කියා කන්නලව් කරනවා. තමුන් ගෙදර ගිහින් නිකම් වාඩි වී නොසිටිනා බව ඔය දරුවන් දන්නවා. අනිවාර්යෙන්ම තම තමන්ගේ චරිත කොටස් රඟදැක්වීමට ඔබලා පහළට පැමිණිය යුතුයි. දැනට මුළු ලෝකයම අපිරිසිදුයි. පරමාත්ම පියා විසින් දැන් ඔබලාව පාරිශුද්ධ කරවමින් සිටිනවා. අරමුණ හා ඉලක්කය ඔබ ඉදිරියේ තිබෙනවා. වෙන කිසිම කෙනෙක්ට මෙවන් අරමුණක් හා ඉලක්කයක් නැහැ. අපි මේ තත්ත්වයට පත් වෙමින් සිටිනවා. පරමාත්ම පියා කියනවා: දරුවනි, ඔබලා මේ තත්ත්වයේ සිටියා. දැන් නැහැ. වන්දනීයව සිටි ඔබලා දැන් වන්දනාකරුවන් වෙලා. නැවතත් වතාවක් වන්දනීය වීමට නම් උත්සාහයක් දැරිය යුතුයි. එවන් හොඳ උත්සාහයක් දැරීමට පරමාත්ම පියා ඔබව දිරිමත් කරවනවා. තමුන් රාජ කුමාරයෙක් වෙනවාය කියා මේ බාබා තේරුම් ගෙන සිටිනවා. මොහු අංක එකේ අයෙක් වුවත් ඔහුටත් නිරන්තර ස්මරණයේ සිටිය නොහැකියි. ඔහුට අමතක වෙනවා. කෙනෙක් කෙතරම් උත්සාහයක් දැරුවත් දැනට තවමත් ඔවුන්ට ඒ තත්ත්වයට පත් විය නොහැකියි. යුද්ධය ළං වන විට කර්මතීත් අවධිය ළඟා වේවි. සෑම කෙනෙක්ම උත්සාහ දැරිය යුතුයි. මොහුත් උත්සාහ දැරිය යුතුයි. ඔවුන්ගෙන් අහන්න: මේ පින්තූරයේ බාබා සිටින්නේ කොතැන ද? අපිරිසිඳු ලෝකයේ හරියටම ගස මුදුනේ ඔහු සිටගෙන සිටිනා ආකාරයත් ඒ ගසේම පාමුලට වී ඔහු තපස් රකින අයුරුත් පෙන්වා තිබෙනවා. මෙය එතරම් සරලව විස්තර කර පෙන්වා තිබෙනවා. මේ සියලුම කරුණු පරමාත්ම පියා විසින් පහදා තිබෙනවා. අපි මේ දේවල් ගැන දැනගෙන සිටියේ නැහැ. පරමාත්ම පියා දැනුමින් පිරි කෙනායි. සෑම කෙනෙක්ම සිහි කරන්නේ ඔහුවයි. ඔවුන් කියනවා: පරමාත්ම පියාණනි, පරමාත්ම ජීවයනි, පැමිණ අපව මේ දුකින් මුදවා ගන්න. බ්‍රහ්ම, විෂ්ණු හා ශංකර් දේවතාවරුනුයි. අශාරීරික ලෝකයේ සිටිනා ජීවාත්ම සත්තාවන් දේවතාවරුන් කියා හඳුන්වන්නේ නැහැ. බ්‍රහ්ම, විෂ්ණු හා ශංකර්ගේ රහස් පරමාත්ම පියා ඔබට පහදා දී තිබෙනවා. බ්‍රහ්මාත්, ලක්ෂ්මී හා නාරායනුත් සිටින්නේ මෙහියි. සූක්ෂම කලාපයේ දර්ශන දැන් ලබන්නේ ඔය දරුවන් පමණයි. මේ බාබාත් ඉටු දේවතාවරයෙක් වෙනවා. ඉනිමගේ ඉහළින්ම සිටගෙන සිටින්නාම පහළට වී තපස් දමින් සිටිනා බව ඔය දරුවන් දන්නවා. පින්තූරයේ මෙය ඉතාමත් හොඳින් පෙන්වා තිබෙනවා. ඔහු තමන්ව දෙවියන් කියා හඳුන්වා ගන්නේ නැහැ. මම පැන්සයක් තරම්වත් වටිනා කෙනෙක් ලෙස සිටියේ නැහැ. ඔබටත් එයම අදාලයි. මම දැන් පවුමක් තරම් වටිනා කෙනෙක් බවට පත් වෙනවා. ඔබටත් එය අදාලයි. මේ කරුණු තේරුම් ගැනීමට ඉතාමත් පහසුයි. කවුරු හෝ කෙනෙක් විරුද්ධ වෙනවා නම් ඔහු සිටින්නේ කලි යුග පාමුල කියා තේරුම් කර කියා දෙන්න. පරමාත්ම පියා කියනවා: තම විශ්‍රාමික කාලයේදී මොහු දිරාපත් අවදියට පැමිණෙන විට මම ඔහු තුළට ඇතුළු වෙනවා. ඔහු දැන් රාජයෝග තපස්යාවේ නිරතව සිටිනවා. තපස්යාවේ සිටිනා කෙනෙක්ට දේවතාවරයෙක් කියා කිව හැකි ද? රාජයෝගය හැදෑරීමෙන් පසුව පමණයි කෙනෙක්ට ඒ තත්ත්වයට පත් විය හැක්කේ. ඔය දරුවන්ව ඔටුණු පළන් අය බවට පත් කරවනවා: ඔබලා දේවතාවරුන් වෙමින් සිටිනවා. තමන් සෑම කෙනෙක්ම ඒ තත්ත්වයට පත් වෙමින් සිටිනා බව පෙන්වීමට දරුවන් 10 දෙනෙකුගේ 20 දෙනෙකුගේ පින්තූර ගෙන පෙන්විය හැකියි. ඒ දිනවල සෑම කෙනෙක්ම එවන් පින්තූරයක් ළඟ තබාගෙන සිටියා. මෙම කරුණ තේරුම් ගත යුතුයි. එක් පැත්තකින් ඔවුන් සරල වන අතර අනිත් පැත්තෙන් ඔවුන් ද්විත්ව ඔටුණු පළන් අය වෙනවා. තමන් ඒ තත්ත්වයට පත් වෙමින් සිටිනවාය කියා ඔබට තේරෙනවා. පැහැදිලි රේඛාවක් ඇති අයට පමණයි ඒ තත්ත්වයට පත් විය හැක්කේ. ඔබලා ඉතාමත් මිහිරි අය විය යුතුයි. මේ වන විට රාගයේ

හා කෝපයේ බීජ සෑම කෙනෙක් තුළම වැඩී වෙලා. ඒ සෑම කෙනෙක් තුළින්ම පාප පහේ ගස ලොකුවට වැවිලා. පරමාත්ම පියා කියනවා: දැන් ආයිත් එවන් බීජ පැළ කරන්න එපා. සංගම් යුගයේදී කිසිම ශාරීරික අවධානයක බීජයක් පැළ නොකළ යුතුයි. රාග බීජය පැළ කරන්න එපා. කල්ප භාගයකටම රාවන නැහැ. පරමාත්ම පියා මෙහි අසුන් ගෙන ඔය දරුවන්ට සෑම කරුණක්ම පහදා දෙනවා. ප්‍රධානම දෙය නම්: මන්මනාභව යි. පරමාත්ම පියා කියනවා: මා සිහි කරන්න. මොහු හරියටම පිටිපස්සෙන් සිටිනවා ඉදිරියේත් සිටිනවා. යෝග බලයෙන් ඔබලා පාරිශුද්ධ වෙනවා. මුල් කාලයේ දරුවන් විවිධාකාර දර්ශන දැක්කා. භක්ති මාර්ගයේ දී කෙනෙකුට දර්ශනයක් ලද හැක්කේ දැඩි භක්තියකින් අනතුරුවයි. මෙහිදී ඔබලා නිකම් වාඩි වුණු සැනෙකින්ම ධ්‍යානගත වෙන්න පටන් ගත්තා. එය විජ්ජාවක් වුණා. එය පළමු ගණයේ විජ්ජාවක්. ඉතාමත් ඉහළ තපස්දමක සිටි මීරා තම මුළු කාලයම සාදුසන්නාසිවරුන් සමඟ ගත කළා. මෙහි කිසිම සාදුවරයෙක් නැහැ. මොහු පරමාත්ම පියායි. ශිව්බාබා සැමගේම පියායි. ගුරුව මුණ ගැසෙන්න ඕනැයි කියා මිනිස්සු ඉල්ලනවා. කෙසේ වෙතත් මෙහි ගුරු කෙනෙක් නැහැ. ශිව බාබා අශාරීරිකයි. ඉතින් ඔවුන් කවුරුන්ව මුණ ගැසෙන්න ද? ඒ ගුරුන්ට ඔවුන් තෑගිබෝග දෙනවා. මේ පරමාත්ම පියා අසීමිතත්වයේ පාලකයායි. ඉතින් ඔහුට කිසිම දෙයක් පිළිගැන්විය යුතුයි කියා නැහැ. මුදල් ගෙන ඔහු මොනවා කරන්න ද? තමන් ලෝක පාලකවරයෙක් වීමට යනවායි කියා බ්‍රහ්මා තේරුම් ගෙන සිටිනවා. දරුවන් දෙන සෑම මුදලක්ම වැය වන්නේ ඔවුන්ටම ගොඩනැගිලි සෑදීමටයි. ශිව බාබාටවත් බ්‍රහ්ම බාබාටවත් මුදල් වලින් වැඩක් නැහැ. මේ ගොඩනැගිලි සාදා තිබෙන්නේ ඔය දරුවන් පැමිණි විට ඇවිත් නැවතී සිටින්නයි. ඇතැම් දරුවන් දිළිඳුයි. ඇතැම් අය පොහොසත්. ඇතැම් අය රුපියල් දෙකක් පවා බාබාට එවා බාබා මගේ නමින් ගඩොලක් තබන්නැයි කියා කියනවා. ඇතැම් අය රුපියල් දහසක් එවනවා. දෙදෙනාගේම අරමුණ එකයි. එමනිසා, ඒ දෙදෙනාටම එය එක හා සමාන වෙනවා. එවිට දරුවන් පැමිණ තමන් කැමති තැනක සිටිය හැකියි. ගොඩනැගිල්ල සෑදූ කෙනා පැමිණි විට විශේෂ සැලකිල්ලක් දක්වනවා. එවිට ඇතැම් අය කියනවා: බාබා ඔවුන්ට විශේෂයෙන් සලකනවා කියලා. ඔව් අනිවාර්යයෙන්ම ඔවුන්ට ඒ සැලකිල්ල දැක්විය යුතුයි. සෑම වර්ගයකම අය සිටිනවා. ඇතැම් අය ඕනෑම තැනක සිටීමට සූදානම්. අනිත් අය හරිම සියුමැලියි. විදේශිකයින් ඉතාමත් විශාල මාළිගා වල වාසය කරනවා. සෑම ජාතියකින්ම ඉතා ධනවත් අය මතු වෙනවා. එමනිසා, එවන් අයට එවන් ගොඩනැගිලි සෑදිය යුතුයි. බලන්න මෙහාට දරුවන් කී දෙනෙක් නම් පැමිණෙනවාද කියලා. වෙන කිසිම පියෙකුට මෙවන් සිතිවිලි පහළ වන්නේ නැතිව ඇති. වැඩිම වුණොත් කෙනෙකුට දරු මුණුපුරන් 10 ක් 12 ක් හෝ 20 ක් සිටිය හැකියි. හොඳයි තවත් කෙනෙකුට 200 ක් 500 ක් වුවත් සිටිය හැකියි. නමුත් ඊට වඩා කිසිම කෙනෙකුට නැහැ. බාබාගේ මේ පවුල හරිම ලොකු පවුලක්. ඒක තව තවත් ලොකු වෙනවා. අධිරාජ්‍යයක් ස්ථාපනය වෙමින් පවතිනවා. පරමාත්ම පියාගේ පවුල කෙතරම් විශාල ද? ප්‍රජාපිතා බ්‍රහ්මාගේ පවුල කෙතරම් විශාල ද? සෑම කල්පයකදී ම ඔහු පැමිණි විට පමණයි මේ අපූරු දේවල් අහගන්න ලැබෙන්නේ. පරමාත්ම පියා ගැන කියනා විට: ඕ, ප්‍රභූ ඔබගේ ක්‍රම විධි අසහායයි කියා කියනවා. මෙය අදාල දැන් මේ කාලයටයි. භක්තිය හා ඥානය අතර වෙනස බලන්න. පරමාත්ම පියා පහදා කියනවා: දෙව්ලොවට යාමට අවශ්‍ය නම් දිව්‍යමය ගුණධර්ම ධාරණය කර ගන්න. දැන් ඔබලා කටු වගෙයි. මට කිසිම ගුණදහමක් නැහැයි කියා ඔවුන් නිතරම කියනවා. කෙසේ වෙතත්, රාවණ රාජ්‍යයේ පාප පහේ දුර්ගුණ තිබෙනවා. ඔබලා දැන් එවන් හොඳ දැනුමක් ලබනවා. ඒ දැනුමින් ඔබට මේ දැනුමින් සේ ලොකු සතුටක් ලැබෙන්නේ නැහැ. ජීවාත්ම සත්තාවන් වන අප අශාරීරික ලෝකයේ වාසය කරන්නන් බව ඔබලා දන්නවා. බ්‍රහ්ම, විෂ්ණු හා ශංකර් සිටින්නේ සූක්ෂම කලාපයේයි. ඒත් දර්ශන දීම සඳහා පමණයි. බ්‍රහ්මා මෙහි සිටිනවා වගේමයි ලක්ෂ්මී නාරායනුත් එහි ඇත්තේ ඔවුන්ගේ දර්ශනයක් පමණයි. භෞතික බ්‍රහ්මා ඉටු දේවතාවරයෙක් වී සූක්ෂම කලාපයේ බ්‍රහ්මා බවට පත් වන්නේ කෙසේදැයි කියා ඉන් පෙන්නුම් වෙනවා. නැතිනම් එවන් දෙයක් නැහැ. ඔය දරුවන් දැන් සියල්ලම හොඳින් තේරුම් ගෙන ධාරණයට ගන්නවා. මේ කරුණු අලුත් ඒවා නොවෙයි. ඔබලා වාර ගණනාවකදී ම දේවතාවරුන් වී සිටිනවා. දේවතා රාජ්‍යයක් තිබුණා. මේ චක්‍රය දිගටම කැරකෙනවා. ඒ නාටක විනාශ වන සුළුයි. නමුත් මෙය සදාතනික අවිනාශී නාටකයකි. ඔබගේ හැර වෙන කිසිම කෙනෙකුගේ සිහියට මෙය ඇතුළු වී නැහැ. පරමාත්ම පියා මෙහි සිට ඔබට සියල්ල පහදා දෙනවා. එය කාලාන්තරයක් තිස්සේ පැවත එන්නක් කියා සඳහන්ව තිබෙනවා. පරමාත්ම පියා කියනවා: මම දැන් ඔබට මෙම ඥානය දෙනවා. පසුව එය අතුරුදන් වේවි. ස්වර්ණමය යුගයේ දී ඔබ ඔබගේ රාජකීය තත්ත්වය ලැබූ පසු මෙම ඥානය ඉතිරි වන්නේ නැහැ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සැම විටම තමන් බ්‍රහමිණ්වරුන් ය යන අවධානයේ සිටින්න. එමනිසා, පාපයන්ගෙන් බොහෝ ඈත් වී සිටින්න. කිසිම විටෙක කිසිම ආකාරයක සාපරාධි පහර දීම් නොකරන්න. පරමාත්ම පියාට ඉතාමත් අවංකව හා විශ්වසනීයව වාසය කරන්න.
2. ද්විත්ව ඔටුනු පළන් රජවරුන් වීමට නම් ඉතාමත් මිහිරි අයෙක් වී ඔබගේ බුද්ධියේ යෝගාව පැහැදිලිව තබා ගන්න. රාජයෝග තපස්දම රකින්න.

**වරදානය:** ඔබ බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්තිය ලද බවට පත්වී අසීමිත අවධියක නිරන්තරව ස්ථාවරව රැඳී සිටිත්වා.

**පාඨය:** විශ්වාසවන්ත බුද්ධියක් ඇති කෙනෙකුගේ සලකුණ නම් ඔහුට ජයග්‍රහණය සහතික කර ඇති අතර ඔහු සැහැල්ලු වීමයි. එවැනි ජීවාත්මයකට කිසිදු නාස්තියක් පැමිණිය නොහැක.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

කර්මයේ ගැඹුරු දර්ශනය තේරුම් ගන්න, එනම්, ඔබ ඕනෑම ක්‍රියාවක් කිරීමට පෙර ත්‍රිකාලදර්ශි වන්න, මන්ද, එවිට පමණක් ඔබට කර්මතීත් විය හැකිය. ඔබ ඔබේ සිතිවිලි වලින් වුවත් සුළු හෝ වරදක් පවා කළහොත්, ඒවා ද ඉතා දරුණු කර්ම ගිණුමක් නිර්මාණය කරයි. මේ නිසා ඔබ කුඩා වැරැද්දක් පවා විශාල වැරැද්දක් ලෙස සැලකිය යුතුය, මන්ද, ඔබ දැන් ඔබේ පරිසමාප්ත අවධියට ආසන්න වෙමින් සිටින බැවිනි.